**විසර්ජන ශීර්ෂය - 276**
**බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාව**

1. **දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්**

i. රජයේ කාර්යයන් සම්බන්ධීකරණය කිරීම
ii. ආදායම් එකතු කිරීම
iii. විමධ්‍යගත අයවැය වැඩසටහන හා ගමනැගුම වැඩ සටහන ක්‍රියාත්මක කිරීම
iv. මැතිවරණ සම්බන්ධීකරණය කිරීම
v. අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල කාර්යයන් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීමේ නියෝජිතයා ලෙස කටයුතු කිරීම
vi. පළාත් සභා කාර්යයන්ට සහාය වීම

2. **දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

i. මහියංගනය
ii. රිදීමාලියද්ද
iii. කන්දකැටිය
iv. මීගහකිවුල
v. සොරණාතොට
vi. ලුණුගල
vii. බදුල්ල
viii. පස්සර
ix. හාලිඇල
x. ඌව පරණගම
xi. වැලිමඩ
xii. ඇල්ල
xiii. බණ්ඩාරවෙල
xiv. හපුතලේ
xv. හල්දුම්මුල්ල

3. **වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම ගිණුම් වර්ෂය ආරම්භයේ පිළියෙල කර නොතිබුණි.

4. **ගිණුම්**

4.1 **මුළු ප්‍රතිපාදනය හා වියදම**

බදුල්ල දිසත්‍රික් ලේකම් කාර්යාලය සහ ඒ යටතේ වූ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 15 ක් සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 419,400,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. 405,229,457 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල ශුද්ධ ඉතිරි කිරීම් රු. 14,170,543 ක් වූ අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 3.38ක් විය. විස්තර පහත දැක්වේ.

| වියදම | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | ශුද්ධ ප්‍රතිපාදනය | තථ්‍ය වියදම | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 345,250,000 | 345,250,000 | 335,769,235 | 9,480,765 | 2.75 |
| මූලධන | 74,150,000 | 74,150,000 | 69,460,222 | 4,689,778 | 6.32 |
| එකතුව | 419,400,000 | 419,400,000 | 405,229,457 | 14,170,543 | |

4. 2 **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් ලැබී තිබුණු ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් පහත සඳහන් පරිදි එකතුව රු.1,760,979,607 ක්වූ ප්‍රතිපාදන ලැබී තිබුණු අතර ඒවා උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වැය ශිර්ෂය | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | වෙන් කළ ප්‍රතිපාදනය | තථ්‍ය වියදම | 2010 දෙසැම්බර් 31 දිනට ඉතිරිය |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| 101 | බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය | 50,000 | 50,000 | - |
| 103 | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය | 210,535 | 193,414 | 17,121 |
| 105 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 718,180,848 | 669,942,581 | 48,238,267 |

| | | | | |
|---|---|---|---|---|
| 106 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 4,478,586 | 3,955,072 | 523,514 |
| 110 | අධිකරණ අමාත්‍යාංශය | 2,625,970 | 1,724,911 | 901,059 |
| 118 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 400,555 | 316,458 | 84,097 |
| 120 | ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | 18,590,650 | 15,097,994 | 3,492,656 |
| 121 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 10,326,978 | 8,051,322 | 2,275,656 |
| 124 | සමාජ සේවා අමාත්‍යාංශය | 3,816,059 | 3,034,851 | 781,208 |
| 127 | කම්කරු සබඳතා සහ ඵලදායීතා ප්‍රවර්ධන අමාත්‍යාංශය | 252,000 | 174,483 | 77,517 |
| 133 | තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | 7,982,581 | 5,919,127 | 2,063,454 |
| 134 | ජාතික භාෂා හා සමාජ ඒකබද්ධතා අමාත්‍යාංශය | 166,650 | 163,817 | 2,833 |
| 140 | පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | 1,118,190 | 582,470 | 535,720 |
| 142 | ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 9,364,037 | 3,420,645 | 5,943,392 |
| 152 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 1,034,578 | 844,665 | 189,913 |
| 153 | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | 6,382,920 | 5,955,937 | 426,983 |
| 156 | යෞවන කටයුතු අමාත්‍යාංශය | 240,650 | 136,804 | 103,846 |
| 160 | පරිසර අමාත්‍යාංශය | 400,000 | 184,680 | 215,320 |
| 201 | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | 6,303,795 | 5,894,645 | 409,150 |
| 204 | හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 700,000 | 588,182 | 111,818 |
| 206 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 9,000 | 6,971 | 2,029 |
| 210 | ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | 8,000 | 8,000 | - |
| 216 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 5,670,057 | 5,566,647 | 103,410 |

| | | | | |
|---|---|---|---|---|
| 217 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 5,244,652 | 4,959,476 | 285,176 |
| 218 | සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 367,140,304 | 357,020,025 | 10,120,279 |
| 219 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 1,000,000 | 1,000,000 | - |
| 220 | ආයුර්වේද දෙපාර්තමේන්තුව | 314,554 | 290,699 | 23,855 |
| 226 | ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | 21,135 | 20,595 | 540 |
| 227 | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | 20,166 | 19,345 | 821 |
| 252 | ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | 2,269,905 | 1,997,197 | 272,708 |
| 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 584,301,691 | 567,793,266 | 16,508,425 |
| 254 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 844,742 | 840,209 | 4,533 |
| 284 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 500,000 | 500,000 | - |
| 286 | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | 7,400 | 4,200 | 3,200 |
| 300 | ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව | 577,319 | 573,243 | 4,076 |
| 307 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 425,100 | 278,491 | 146,609 |
| | | 1,760,979,607 | 1,667,110,422 | 93,869,185 |

ඉහත ප්‍රතිපාදන සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**

<u>ගම නැගුම ව්‍යාපෘතිය</u>

(i) <u>පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය</u>

බටහිර බිබිලේගම වැවේකැලේ සිට මහගෙදර දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීමේදී නියමිත දිගට වඩා මීටර් 4.26 ක් අඩුවෙන් කොන්ක්‍රීට් කිරීම නිසා කොන්ක්‍රීට් ඝනමීටර් 2.33 ක් සඳහා රු.26,646 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ii) <u>හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය</u>

ගොරඩියවක එළදළුව බෝක්කුව අළුත්වැඩියාව හා මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය සඳහා අනුමත ඇස්තමේන්තුව අනුව විෂය අංක 1.3 හා 1.4 යටතේ පිටතින් පස් ප්‍රවාහනය කර පුරවා තැලීම යන වැඩ කොටස් ඉටුකර නොමැතිව ඒ වෙනුවට එම ස්ථානයෙන් ඉවත් කළ පස් යොදා කර්මාන්තය නිම කර ඒ සඳහා රු.24,771 ක් ගෙවා තිබුණි.

(iii) <u>ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය</u>

පිළිගත් ලියාපදිංචි සිමිති මගින් ඉටුකරන ලද කර්මාන්ත වලට ගෙවීමේදී සමිතියේ නිලධාරීන් දෙදෙනෙකුගේ අත්සන් ලබා නොගෙන කර්මාන්ත 06 කට රු. 249,598 ක් ගෙවා තිබුණි.

(iv) <u>පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (විමධ්‍යගත වැය)</u>

2009 විමධ්‍යගත වැඩසටහන් යටතේ ක්‍රීඩා සමිති වලට බෙදාදීම සඳහා රු.74,195 ක වියදමක් දරා මිලදී ගෙන තිබු ක්‍රීඩා භාණ්ඩ වලින් රු.41,205 ක් වටිනා ක්‍රීඩා භාණ්ඩ 62 ක් 2010 දෙසැම්බර් 10 විගණන දින දක්වාම ප්‍රතිලාභීන් වෙත බෙදා දී නොතිබුණි.

(ආ) **තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය**

පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් පරිපාලනය වන විදාතා සම්පත් මධ්‍යස්ථානයට මිලදී ගත් අයත් වියලන යන්ත්‍රය, පොල් තෙල් සිඳින යන්ත්‍රය, බේකරි උදුන හා යෝගට් ඉන්කියුබේටරය ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පවතින බව 2010 දෙසැම්බර් 09 දින සිදුකල විගණන පරීක්ෂණ වලදී අනාවරණය විය.

(ඇ) **ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය**

<u>ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය</u>

(i) පෝෂණ ඌනතාවයෙන් පෙලෙන අඩු ආදායම් ලාභී පවුල්වල දරුවන් සඳහා නැවුම් කිරි වීදුරුවක් ලබාදීමේ වැඩසටහන යටතේ ලබා දෙන කිරිවල සෞඛ්‍ය ආරක්ෂිත තත්ත්වය හා ගුණාත්මකභාවය පිළිබඳ, 2009 දෙසැම්බර් 22 දිනැති අංක 2009/01(05) දරන ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශයේ ලේකම්ගේ චක්‍රලේඛයේ 05.04 ඡේදය පරිදි ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක ගෙන් සහ පශු වෛද්‍ය නිලධාරී ගෙන් නිර්දේශ ලබාගෙන නොතිබුණි.

(ii) පෝෂණ ඌනතාවයෙන් පෙලෙන අඩු ආදායම් ලාභී පවුල්වල දරුවන් සඳහා නැවුම් කිරි වීදුරුවක් ලබාදීමේ වැඩසටහන සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 10 කින් බර අඩු ළමුන් 286 ක් හඳුනාගෙන තිබු අතර කිරි වීදුරුව ලබා දෙනු ලබන්නේ කොට්ඨාශ 04 ක ළමුන් 194 ක් සඳහා පමණි. අනෙක් ළමුන් සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක නොකිරීමෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් රු.170,000 ක් ඉතිරිවී තිබුණි.

(ඈ) **ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

<u>හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය</u>

සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් දියතලාව සංස්කෘතික මධ්‍යස්ථානයේ වහලය හා රංග ශාලාව ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් 2008 ජුනි 19 දින ලබාදුන් රු.858,963 ක මුදලින් රු.735,997 ක් වියදම් දරා ඉතිරි මුදල වු රු.122,966 සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වෙත ආපසු යවා නොතිබුණි.

(ඉ) **විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව**

<u>ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය</u>

ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 8/2010 හා 2010 සැප්තැම්බර් 7 දිනැති චක්‍රලේඛයේ සඳහන් උපදෙස් වලට පටහැනිව 41 දෙනෙකු සඳහා වැඩිපුර ගෙවා ඇති රු.66,500 ක ජීවන වියදම් දීමනාව ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.3 **විගණනය හා විගණන විෂය පථය**

-------------------------------------

බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2011 අගෝස්තු 30 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

4.4 **ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම**

------------------------------------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම, රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවසථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

4.5 **ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළිබඳ විගණන නිරීක්ෂණ**

----------------------------------------------------------

2010 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම, රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශවල තත්ත්වය මෙහි (අ) සිට (ඈ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 4.1 සිට 4.13 දක්වා වූ ඡේදවල ඇතුලත් වෙනත් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) **ගිණුම් ඉදිරිපත් කිරීම**

---------------------

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2011 මාර්තු 31 දින වන විට පහත සඳහන් ගිණුම් විගණනයට ඉදිරිපත් කර තිබුණි.

| ශීර්ෂය/ විෂය අංකය | ගිණුමේ නම |
|---|---|
| 276 | විසර්ජන ගිණුම |
| 27601 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය |

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක් විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බණ්ඩාරවෙල හා පස්සර ප්‍රාදේශිය ලේකම් කාර්යාල | ස්ථාවර වත්කම් ලේඛනය | මු.රෙ. 502(2) | පොදු 287 ආකෘතියෙහි ස්ථාවර වත්කම් ලේඛනයක් ක්‍රමවත්ව පවත්වාගෙන නොතිබුණි. |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල, මහියංගණය, ලුණුගල හා හාලිඇල ප්‍රාදේශිය ලේකම් කාර්යාල | ඇප ලේඛනය | මු.රෙ.891 | ඇප ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | පොදු තැන්පත් ලෙජරය | මු.රෙ.565 | තැන්පතු ලෙජරයේ අවසාන පිටුවේ පවත්වා ගතයුතු තුලන ගිණුම පවත්වාගෙන නොතිබුණි. |
| මහියංගණය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | පාඩු පිළිබඳ ලේඛනය | මු.රෙ.110(1) | පාඩු පිළිබඳ වාර්තා කිරීම සඳහා ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. |
| මහියංගණය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | බැරකම් පිළිබඳ ලේඛන | මු.රෙ.211(1) | ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම් වෙනුවෙන් සැපයුම් කරුවන්ට ගෙවීමට තිබුන බැරකම් පිළිබඳ විස්තර ලේඛනයක සඳහන් කර නොතිබුණි. |
| වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | දෛනික ලැබීම් වර්ගීකරණ ලේඛනය | මු.රෙ.183(3) | දෛනික ලැබීම් වර්ගීකරණ ලේඛනය වගකිවයුතු නිලධාරියෙකු විසින් දෛනිකව පරීක්ෂා කර නොතිබුණි. |
| පස්සර හා ලුණුගල ප්‍රාදේශිය ලේකම් කාර්යාල | පරිගණක වත්කම් ලේඛනය | භාණ්ඩාගාර චක්‍රලේඛ IAI/2002/2 | පරිගණක,උපාංග හා මෘදුකාංග ඇතුලත් කිරීම සඳහා ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

(iii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ බිල්පත් හා ලිපිගොණු ආදී වූ අවශ්‍ය සාක්ෂි නොතිබිම නිසා එකතුව රු.250,387 ක මුදලකට අදාල වූ ගනුදෙනු 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

(ආ) **අයවැය විචලනය**

-------------------

වැය විෂයයන් 09 ක් සදහා අධි ප්‍රතිපාදන සලසා තිබිම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය, ශුද්ධ ප්‍රතිපාදනයෙන් 11.14 % ත් 25.66 % අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

(ඇ) **පොදු තැන්පත් ගිණුම**

-----------------------

වර්ෂ 2 ක්ට වැඩි රු. 18,282,863 ක් වූ තැන්පත් ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) **රජයේ නිලධාරින්ට අත්තිකාරම් පිළිබඳ සැසදුම් ප්‍රකාශය**

---------------------------------------------------------

විෂය අංක 27601 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් පිළිබඳ සැසදුම් ප්‍රකාශ අනුව 2010 දෙසැම්බර් 31 දින වන විට අයවිම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු. 8,194,374 ක්වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

(i) රජයේ නිලධාරීන්ගේ ණය සහ අත්තිකාරම් පාලන ගිණුම හා මාසික ගිණුම් සාරාංශ අතර හර රු.5,000 කින් හා බැර රු.105,725 කින් වෙනස් විය.

(ii) හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2008 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එනු ලබන වැඩිපුර හර කිරීම් රු.380 ක් හා හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩිපුර බැර කිරීම් රු.5,910 ක් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය/අත්තිකාරම් ශේෂය රු.6,134,764 ක්වූ අතර ඉන් රු.722,799 ක් වර්ෂ 03 කට වැඩි සහ රු.3,820,608 ක් වසර 05 කට වැඩි පැරණි ශේෂයන් විය.

(iv) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර ස්ථාන මාරුවීම් ලැබූ සේවයේ නියුක්ත නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 38,150 ණය ශේෂ සේවයේ නියුක්ත නිලධාරීන්ගේ ණය ශේෂ ලේඛනය වෙනුවට ස්ථාන මාරු වී පැමිණි හා ගිය නිලධාරීන්ගේ ණය ලේඛන වල දක්වා තිබුණි.

(v) අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු / දිස්ත්‍රික් ලේකම් කාර්යාල / ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට මාරුවී ගිය නිලධාරීන් 09 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 339,255 ක ණය ශේෂ 2004 ඔක්තෝබර් 11දින අයවැය චක්‍රලේඛ 118 හි 1.1.6 ජේදය පරිදි මාසික ගිණුම් සාරාංශ මගින් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(vi) පළාත් සභා හා පළාත් පාලන ආයතන වලට මාරුවී ගිය නිලධාරීන් 58 දෙනෙකුගෙන් අයවිය යුතු රු.5,760,359 ක ණය ශේෂ 2004 ඔක්තෝබර් 11 දින අංක 118 දරන අයවැය චක්‍රලේඛයෙහි 3.2.1 සහ 3.2.2 ජේද ප්‍රකාරව එකවර අයකිරීමට හෝ ණය වාරිකය සහ පොළිය මාසිකව ගෙන්වා ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(vii) මහියංගණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කර ඌව පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යාංශයට ස්ථානමාරු ලැබූ නිලධාරීයෙකුගෙන් අයවිය යුතු ණය ශේෂයක් පළාත් සභාවට පවරාගෙන මහියංගණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පියවිය යුතු රු.242,373 ක ණය ශේෂය මේ දක්වා පියවා නොතිබුණි.

(viii) මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.566,652 ක් වූ ණය ශේෂයෙන් රු.416,979 ක් වර්ෂ 05 කට වඩා පැරණි ශේෂයන් විය.

(ix) මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ අයකර ගන්නා ලෙස ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ඉල්ලා යවා තිබේද යන්න පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොවීය.

(x) වැඩ තහනමට ලක් වු නිලධාරීන් 13 දෙනෙකුගෙන් අයවිය යුතු රු.396,878 ක් වු ණය ශේෂයෙන් රු.161,946 ක් වර්ෂ 03 කට වඩා පැරණි වු අතර රු.119,591 ක් වසර 05 කට වඩා පැරණි ශේෂයන් විය.

(xi) වැඩ තහනම් කර ඇති නිලධාරීන් 13 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය වු රු.396,878 ක ණය මුදල් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 වගන්තිය අනුව ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට හෝ 4.6 වගන්තිය අනුව ඒ සම්බන්ධයෙන් අප්‍රමාදව නීතිපතිගෙන් උපදෙස් ලබාගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(xii) හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිට සේවය අතහැර ගිය නිලධාරීයකුගෙන් අයවිය යුතු දේපළ, වාහන, ආපදා ණය ශේෂය වු රු.1,096,080 ක මුදල හා අදාල පොලිය ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 වගන්තිය අනුව ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට හෝ 4.6 වගන්තිය අනුව ඒ සම්බන්ධයෙන් අප්‍රමාදව නීතිපතිගෙන් උපදෙස් ලබාගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(xiii) ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන් වෙනුවෙන් 2010 දෙසැම්බර් 31 දිනට පියවිය යුතු රු.2,912,545 ක්වු ණය ශේෂයෙන් රු.2,248,812 ක් වර්ෂ 05 කට වඩා පැරණි ශේෂයන් විය.

(xiv) පළාත් සභාවෙන් බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට මාරුවී පැමිණි නිලධාරීන් 31 දෙනෙකුගෙන් අයකරනු ලබන රු.2,845,803 ක ණය වාරික මුදල් 2004 ඔක්තෝබර් 11 දින අංක 118 දරන අයවැය චකලේඛයෙහි 3.1.2. ජේදය අනුව පළාත් සභාව වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(xv) පෙර වර්ෂවල සිට පැවත එන රු.1,668 ක වැරදි හර කිරීම් මෙම වර්ෂය තුලදී ද නිරවුල් කර නොතිබුණි.

(xvi) අදාල වර්ෂය තුලදී පියවිය යුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් විසින් ලබාදෙන ලද විශේෂ අත්තිකාරම් වලින් රු.2,250 ක ශෙෂයක් වර්ෂය තුලදී අයකර නොතිබුණි.

(xvii) නිලධාරීන් දෙදෙනෙකුගේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ශේෂ නිරවුල් කිරීම සඳහා බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට 2007 වර්ෂයේදී ලැබී තිබුන රු.1,400 ක් අදාල නිලධාරීන්ගේ අත්තිකාරම් නිරවුල් කිරීම සඳහා යොදා නොගෙන පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

4.6 **වත්කම් කළමනාකරණය**

(අ) **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

(i) ප්‍රයෝජනයට ගතහැකි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහන දෙකක්ද, ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාහන දෙකක් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි. නමුත් වාහන පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම සඳහා 2010 වර්ෂයේ වෙන් කළ ප්‍රතිපාදන වලින් රු.1,407,316 ක් ඉතිරිව තිබුණි.

(ii) අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගත නොහැකි බවට බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මෝටර් රථ පරීක්ෂක විසින් 2009 ඔක්තෝබර් 14 දින නිර්දේශ කරන ලද වාහන 08 ක් 2010 දෙසැම්බර් 31 දින දක්වා අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ**

මහියංගණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හා නිල නිවාසයේ රු.180,980 ක භාණ්ඩ ඌණතාවයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 757(2) ප්‍රකාරව සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව කටයුතු කර නොතිබුණි.

4.7 **අනුකූල නොවීම්**

(අ) **නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීත, රීති, රෙගුලාසි හා කළමානාකරණ තීරණයන්ට යොමුව. | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (i) **ආයතන සංග්‍රහය** | | |
| ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදය | - | මහියංගණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර ප්‍රාදේශීය ලේකම් නිල නිවසේ 2005 ජුලි සිට 2008 මැයි දක්වා පදිංචිව සිටි මහියංගණ මූලික රෝහලේ විශේෂඥ වෛද්‍යවරුන් 03 කු ගෙන් නිවාස කුලී අයකරගෙන නොතිබුණි. |
| | - | මහියංගණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිල නිවාස හා අදාල දෙපලවල භාරය වෙනස් වන අවස්ථා වලදී නිසි පරිදි භාරදීම හා භාරගැනීම |

සිදුකර නොතිබුණි.

(ii) **මුදල් රෙගුලාසි**

| | | |
|---|---|---|
| 168(3) | - | හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් භාවිතා නොකළ ලදුපත් 03 ක් අවලංගු කර නොතිබුණි. |
| 565(5) | - | හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශ ඊළඟ මාසය අවසන් වීමට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| 892 | - | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල, මහියංගනය, බණ්ඩාරවෙල, හාලිඇල, ලුණුගල හා සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඇප තැබීමට අවශ්‍ය සියළුම නිලධාරීන්ගේ සංශෝධිත වාර්තාවක් සෑම වර්ෂ 03 ක් අවසානයේදී පිළියෙල කර අමාත්‍යාංශයේ ලේකම් හා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. |

(iii) **චක්‍රලේඛ විධිවිධාන**

**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 1989 අගෝස්තු 09 දිනැති චක්‍රලේඛ අංක 39/89 | - | සොරණාතොට හා හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් නිවාඩු දින වැටුප් ගෙවීම් සටහන් කිරීම සඳහා ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| 2006 ජුලි 14 දිනැති චක්‍රලේඛ අංක 11/2006 | - | පස්සර හා හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් දෛනික ධාවන සටහන් සහ ලොග් පොත් නඩත්තු කර නොතිබුණි |

(ආ) **බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අන්දමින් ක්‍රියා කළ අවස්ථා පහත දැක්වේ.

එකතුකළ අගය මත බදු

(i) හපුතලේ, හාලිඇල, ලුණුගල හා සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් අයකල රු. 19,869 ක එකතු කළ අගය මත බදු, 2006 අංක 08 දරන එකතු කළ අගය මත බදු (සංශෝධිත) පනතේ 11(I) වගන්තිය ප්‍රකාරව ඊළඟ මස 20 දිනට ප්‍රථම දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ii) හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2003 අංක 07 දරන එකතු කළ අගය මත බදු (සංශෝධිත) පනතේ 03වන වගන්තියට අනුව රු.147,400 ක් වටිනා සැපයුම් සඳහා බදු ඉන්වොයිස් පත්‍ර ලබා ගෙන නොතිබුණි.

(iii) සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2.1 වගන්තිය ප්‍රකාරව අවස්ථා 03 කදී එකතු කළ අගය මත බදු රු.4,174 ක් අයකර නොතිබුණි.

ජාතිය ගොඩනැගීමේ බදු
--------------------------

(iv) හාලිඇල හා සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් දැව බලපත්‍ර ගාස්තු මත අයකළ ජාතිය ගොඩනැගීමේ බදු රු. 2,201 ක් 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 04 වන වගන්තිය ප්‍රකාරව ඊලග මස 20 වෙනි දිනට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

රඳවාගැනීමේ බදු
---------------------

(v) හපුතලේ, හාලිඇල, ඌව පරණගම හා පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 153 ප්‍රකාරව 2008 වර්ෂයේ හා 2010 දෙසැම්බර් මාසයට අදාලව රඳවාගත් බදු රු.355,708 ක මුදලක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(vi) මහියංගණය ප්‍රාදේශය ලේකම් කාර්යාලය විසින් 2010 ලෝක ආදිවාසී දිනයට සමගාමීව සංවර්ධනය කල දඹාන මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයට රු.68,500 ක් ගෙවා මිලදීගත් භාණ්ඩ සඳහා 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 153 වගන්තිය ප්‍රකාරව රඳවාගැනීමේ බදු 5% අඩුකර නොතිබුණි.

(vii) ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2007 අංක 10 දරණ දේශීය ආදායම් (සංශෝධන) පනතේ 36 වැනි වගන්තිය ප්‍රකාරව ඉදිකිරීම් කටයුතු සඳහා ගෙවීම් කිරීමේදී කොන්ත්‍රාත් 04 ක් සඳහා අය කල යුතු 1% ක රඳවාගැනීමේ බදු රු.1,382 ක් අඩුවෙන් අයකර තිබුණි.

මුද්දර බදු
-----------

(viii) 2008 ජනවාරි 01 දිනැති අංක 1530/13 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් 2006 අංක 12 දරන මුද්දර ගාස්තු පනතේ 03 වැනි වගන්තියට කරන ලද සංශෝධනය ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නිලධාරීන් 11 දෙනෙකුගෙන් 2008 ජනවාරි සිට 2010 සැප්තැම්බර් දක්වා වැටුප් ගෙවීමේදී අයකළ යුතු රු.4,825 ක මුද්දර ගාස්තු අයකර නොතිබුණ.

(ix) 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 07 වගන්තිය ප්‍රකාරව හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මුද්දර බදු සමතයකට පත් කිරීම සඳහා ලියාපදිංචි වී දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ අවසරය ලබාගත් බවට ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

(x) පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2008 ජනවාරි 01 දිනැති අංක 1530/13 දරන ගැසට් නිවේදනය අනුව මත්පැන් බලපත් නිකුත් කිරීම වෙනුවෙන් 2008 මාර්තු 26 දින අයකළ රු.10,000 ක මුද්දර ගාස්තුව දෙශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(xi) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මුද්දර බදු නියෝජ්‍ය කොමසාරිස් විසින් 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනතේ 13 වන වගන්තිය හා 45(2) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද නිවේදනය ප්‍රකාරව මුද්දර බදු සමතයකට පත් කිරීමට බලය ලබාගෙන ඇති පස්සර හා ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාල මුද්දර ඇලවීමෙන් වැලකී මුද්දර බදු ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.

## 4.8 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

-------------------------------------

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

(අ) **ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

(i) ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය විසින් 2008 වර්ෂයේදී ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබූ රු.300,000 ක ප්‍රතිපාදන උපයෝගී කර ක්‍රියාත්මක කළ යුතුව තිබුන චක්‍රීය ණය වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) ගම නැගුම ව්‍යාපෘත

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළයුතුව තිබුන දිනය | ආරම්භ නොකිරීමට හේතු |
|---|---|---|---|---|
| | | රු. | | |
| හාලිඇල | බැද්දේගම පිරියවත්ත සිට ගොඩමුදුන දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 500,000 | 2010-12-22 | ඉඩම් පවරා ගැනීමට නොහැකිවීම |
| | කැටවල දියගිනිඇල්ල දක්වා පස්කපා පැති බැම්ම හා බෝක්කුව ඉදිකිරීම | 500,000 | 2010-12-21 | අයහපත් කාලගුණ තත්ත්වය |
| වැලිමඩ | මල්පොත මලින්තැන්න කිරිදෝන මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 500,000 | 2010-09-30 | ගිවිසුම්ගත සමිතිය කර්මාන්තය ඉටුකිරීම ප්‍රතිකෂේප කිරීම |
| | බිබිලිගමුව කිරිදිඇල මහලියද්දගොඩ මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 500,000 | - | කර්මාන්තය භාරගැනීමට සමිතියක් ඉදිරිපත් නොවීම |

(ආ) **ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්**

දිසත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපාති ආරම්කර තිබුණත්, එම ව්‍යාපෘති නිම නොකර අතහැර දමා තිබුණි.

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | 2010 දෙසැම්බර් 31 දිනට වියදම | අතහැර දැමීමට හේතු |
|---|---|---|---|---|---|
| | | රු. | | රු. | |
| මහියංගණය | බතලයාය ඉහල කොටස ගම්මාන මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 1,000,000 | 2010 ඔක්තෝබර් 29 | 204,200 | අයහපත් කාලගුණ තත්ත්වය |
| | දෙහිගොල්ල රඹුක්යාය ඉදල්ගස්යාය මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 1,000,000 | 2010 නොවැම්බර් 12 | 204,200 | අයහපත් කාලගුණ තත්ත්වය |
| රිදීමාලියද්ද | ගැමුණුපුර ජන උදාන ගම්මානයේ පානීය ජල ව්‍යාපෘතිය | 1,000,000 | 2010 දෙසැම්බර් 01 | 368,434 | අයහපත් කාලගුණ තත්ත්වය |
| | අභයපුර මිරිස්වගාව වැව පානීය ජල ව්‍යාපෘතිය | 1,000,000 | 2010 නොවැම්බර් 29 | 267,895 | මහ කන්නයේ ගොවිතැන් කටයුතු නිසා ප්‍රජා දායකත්වය ලබා ගැනීමට නොහැකිවීම |
| | තිස්සපුර 3 පානීය ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | 1,000,000 | 2010 දෙසැම්බර් 01 | 63,841 | මහ කන්නයේ ගොවිතැන් කටයුතු නිසා ප්‍රජා දායකත්වය ලබා ගැනීමට නොහැකිවීම |

| | | | | | |
|---|---|---|---|---|---|
| කන්දකැටිය | මොරහෙල මණ්ඩිය ඒ 37 හා ඒ 39 නිවාස අසලින් යන කෘෂි මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 1,000,000 | 2010 දෙසැම්බර් 06 | 674,994 | අයහපත් කාලගුණ තත්ත්වය |
| | නිවාස දහයට යන මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 50,000 | 2010 නොවැම්බර් 29 | 282,866 | අයහපත් කාලගුණ තත්ත්වය |
| | මීගහඇල්ල මාර්ගය අඩි 08 ක් පහලට පස් කපා බැම් දැම්ම | 1,000,000 | 2010 නොවැම්බර් 29 | 583,816 | අයහපත් කාලගුණ තත්ත්වය |
| බදුල්ල | නෙළුම්වැව සිට පැගොඩවත්ත දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 500,000 | 2010 නොවැම්බර් 10 | 266,096 | අයහපත් කාලගුණ තත්ත්වය |
| | අන්දෙණිය පල්ලියවත්ත මාර්ගය සහ කාණු පද්ධතිය | 1,000,000 | 2010 ඔක්තෝබර් 29 | 625,029 | අයහපත් කාලගුණ තත්ත්වය |
| | දමන්වර බදුළුගස්කඳුර බෝධිය අසල සිට දක්වා යන මාර්ගය | 700,000 | 2010 ඔක්තෝබර් 27 | 271,112 | අයහපත් කාලගුණ තත්ත්වය |
| | බදුළුපිටිය කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම | 1,000,000 | 2010 නොවැම්බර් 10 | 52,038 | අයහපත් කාලගුණ තත්ත්වය |
| ඇල්ල | ගෝවුස්ස රබර්වත්ත හරහා යන කෘෂිමාර්ගය | 1,000,000 | 2010 නොවැම්බර් 10 | 692,563 | අයහපත් කාලගුණ තත්ත්වය |
| | පියරපන්දෝව නෙළුව මාර්ගය පස්කපා බෝක්කු දැම්ම | 1,000,000 | 2010 පෙබරවාරි 25 | 864,232 | ඉඩම් නිදහස් කර ගැනීමට නොහැකිවීම |
| | මිල්ලගම බොරබැද්ද වෙල්සි මාර්ගය | 1,000,000 | 2010 නොවැම්බර් 10 | 471,337 | ඉඩම් නිදහස් කර ගැනීමට නොහැකිවීම හා අයහපත් කාලගුණ තත්ත්වය |

| | | | | | |
|---|---|---|---|---|---|
| වැලිමඩ | අක්කර 28 මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 500,000 | | 384,931 | අවිච්ඡේද ව්‍යාපෘතියකි |
| ඌවපරණගම | දියුලන හත්කිද මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 1,000,000 | 2010 දෙසැම්බර් 02 | 109,061 | මාර්ගය නාය යැමට ලක්වීම |
| පස්සර | සර්වෝදය මාවත කොන්ක්‍රීට් කිරීම | 1,000,000 | 2010 ඔක්තෝබර් 04 | 206,778 | අයහපත් කාලගුණ තත්ත්වය |
| | ගල්බොක්ක මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 1,000,000 | 2010 ඔක්තෝබර් 25 | 710,765 | අයහපත් කාලගුණ තත්ත්වය |

(ඇ) **භාණ්ඩ හා සේවා සැපයීම රහිතව මුදල් නිදහස් කිරීම**

---------------------------------------------------

මහියංගණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා ගෙවීම් කිරීමේදී මුදල් රෙගුලාසි 215(1) ට පටහැනිව භාණ්ඩ ලැබීමට පෙර රු.137,365 ක් සැපයුම්කරු වෙත ගෙවා තිබුණි.

4.9 **බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

-----------------------------------

**ගැලැපුම් කළ යුතු ශේෂ**

------------------------

2010 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 12 ක් විසින් පිලියෙල කර තිබුණු බැංකු ප්‍රකාශවල දැක්වුණු ගැලැපුම් පිලිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| **ගැලැපුම් පිලිබඳ විස්තරය** | | **කාල විශ්ලේෂණය** | | **එකතුව** |
|---|---|---|---|---|
| | | **මාස 6 වැඩි වර්ෂ 1 ට අඩු** | **වර්ෂ 1ට වැඩි 3 ට අඩු** | |
| | | **රු.** | **රු.** | **රු.** |
| (i) | උපලබ්ධි නොවූ තැන්පතු | 3,974 | 4,400 | 8,374 |
| (ii) | නිකුත් කල නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 190,895 | 17,778 | 208,673 |
| (iii) | හඳුනා නොගත් හර | 535 | 69,314 | 69,849 |
| (iv) | හඳුනා නොගත් බැර | 366 | 480 | 846 |

4.10 **අවිධිමත් ගනුදෙනු**

**-------------------**

**අධිකාර බලය නොමැති වූ ගනුදෙනු**

**-------------------------------------**

1997 පෙබරවාරි 03 දිනැති අංක 6/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව වෙනත් කාර්යාලයක වැඩබැලීමේ රාජකාරී සඳහා යාම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක නිලධාරීන් 07 දෙනෙකුට රු.137,250 ක් සංයුක්ත දීමනා ගෙවා තිබුණි.

4.11 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**----------------------------**

විසර්ජන ගිණුමේ ඇතුලත් පාඩු පිළිබඳ ප්‍රකාශය අනුව1998 හා 2008 වර්ෂයේ පහත සඳහන් වාහන අනතුරු 03ක් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ප්‍රමාදයක් දක්නට ලැබුණි.

| කාර්යාලය | වාහන අංකය | අනතුර සිදුවූ දිනය | අලාභයේ වටිනාකම |
|---|---|---|---|
| | | | රු. |
| පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 32 - 1658 | 1998 සැප්තැම්බර් 13 | 79,250 |
| ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | UPPA - 4962 | 2008 ජනවාරි 18 | 271,213 |
| කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | UPPA - 4965 | 2008 පෙබරවාරි 24 | 69,593 |

4.12 **මානව සම්පත් කළමනාකරණය**

(අ) අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු

2010 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරේක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෝෂ්ඨ මට්ටම | 51 | 43 | 08 | - |
| තෘතික මට්ටම | 39 | 25 | 14 | - |
| ද්විතික මට්ටම | 1,019 | 820 | 199 | - |
| ප්‍රාථමික මට්ටම | 135 | 118 | 17 | - |
| වෙනත් (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 04 | 19 | - | 15 |
| | 1,248 | 1,025 | 238 | 15 |

(ආ) 2006 වර්ෂයේදී සේවා අවශ්‍යතාවය අනුව කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවාගත්, 2009 නොවැම්බර් 25 දිනැති අංක 20/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි සඳහන් සුදුසුකම් සපුරා නොතිබුණ ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයන් දෙදෙනෙකු තව දුරටත් සේවයේ යොදවා තිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 880, 1999 අපේල් 09 දිනැති අංක ඊ/9/2/ඇප දරන ස්වදේශ කටයුතු හා පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව සහ ඇප ආඥා පනතේ 2 (සී) වගන්තියට අනුකූලව ඇප තැබිය යුතු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් 13 දෙනෙක් හා ප්‍රාදේශය ලේකම් කාර්යාල 06 ක නිලධාරීන් 53 දෙනෙකු විසින් රු.672,500 ක ඇප මුදල් තැන්පත් කර නොතිබුණි.

4.13 **අභ්‍යන්තර පාලනය**

-------------------

(අ) **අභ්‍යන්තර විගණනය**

---------------------

(i) 2009 ජුනි 09 දිනැති අංක DMA/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව අභ්‍යන්තර විගණකවරයෙක් හා ප්‍රමාණවත් කාර්‍ය මණ්ඩලයක් සහිතව අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 කට අදාලව 2010 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

(ආ) **කළමනාකරණ හා විගණන කමිටු ක්‍රියාත්මක කිරීම**

---------------------------------------------------

(i) 2009 ජුනි 09 දිනැති අංක DMA/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය පරිදි කමිටුව නියෝජනය කිරීම සඳහා අභ්‍යන්තර විගණකවරයෙක් පත්කර නොතිබුන අතර නිරීක්ෂකයෙකු ලෙස විගණකාධිපතගේ නියෝජිතයෙකු කැඳවා නොතිබුණි.

(ii) 2010 වර්ෂයට අදාලව කළමනාකරණ හා විගණන කමිටුව අවස්ථා 03 කදී පමණක් රැස් වී තිබුණි.